කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය- නූතන ලෝක ඉතිහාසය

ශ්‍රේණිය - 12

සකස් කළ ගුරුභවතාගේ නම - එම්.කේ.සරෝජා සිසිර කුමාරි මිය.

පාසල - ර/උඩුවක සිද්ධාර්ථ ම.වි.

පාඩම - 1

## 1.නූතන ලෝකයේ උදාව

නිවැරදි පිළිතුර තෝරන්න.

1.) ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් ලෙස ගොඩ නැගීමට දායක වූයේ,

1. පර්ඩිනන්ඩ් හා ඉසබෙලා යුවල
2. මුස්ලිම්වරු
3. කොලම්බස්
4. ශුද්ධ රෝම අධිරාජ්‍යයා
5. මැගලන්

2.) පෙර අපර දෙදිග ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන්ට යටත් වූ වර්ෂය වන්නේ,

1. 1345
2. 1245
3. 1453
4. 1400
5. 1405

3.) දේශ ගවේෂණ ව්‍යාපාරය පිළිබඳ සාවද්‍ය තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. බර්තොලමියු දියස් - සුභ පැතීමේ තුඩුව සොයා ගැනීම
2. ඇමරිගෝ වෙස්පුචි - නිව්ෆවුන්ඩ්ලන්තය සොයා ගැනීම
3. ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ - පීරු ප්‍රදේශය සොයා ගැනීම
4. වස්කෝ ද ගාමා - කැලිකට් වරායට පැමිණීම
5. ක්‍රිස්ටෝපර් කොලොම්බස් - කැරිබියන් දූපත් සොයා ගැනීම

4.) දේශ ගවේෂණ ව්‍යාපාරය ඇතිවීමට බලපෑ සාධකයක් නොවන්නේ,

1. ලෝකය පිළිබඳ ඇති වූ කුතුහලය
2. අධිරාජ්‍ය ගොඩනැගීම
3. නව වෙළෙඳ නගර බිහිවීම
4. රාජ්‍ය අනුග්‍රහය ලැබීම
5. ත්‍රාසජනක අත්දැකීම් ලැබීමේ ආශාව

5.) දේවවරම්වාදී අදහස් තම රාජ්‍යත්වය තහවුරු කිරීමට යොදා ගත්තේ,

1. දාහතර වන ලුවී රජු
2. රිචලියු
3. හතරවන හෙන්රි
4. නාවික හෙන්රි
5. ඉසබෙලා රැජිණ

6.) දාහතරවන ලුවී රාජ්‍ය සමය ලෙස සැලකෙන්නේ,

1. 1243 – 1310
2. 1650 – 1700
3. 1643 – 1715
4. 1642 – 1708
5. 1533 – 1563

7.) 1519 දී මැක්සිමිලියන් අධිරාජ්‍යයාගේ මරණයෙන් පසු ශුද්ධ රෝම අධිරාජ්‍ය තනතුර හිමි වූයේ,

1. පර්ඩිනන්ඩ් කුමරුට
2. පස්වන චාල්ස්ට
3. ඉසබෙලා
4. දෙවන පිලිප්
5. රිචලියු

8.) “යහපත් හෙන්රි” නමින් හැඳින්වූ පාලකයා වන්නේ,

1. තුන්වන හෙන්රි
2. හතරවන හෙන්රි
3. දාසය වන ලුවී රජු
4. දෙවන පිලිප් රජු
5. පළවන චාල්ස්

9.) ජාතික රාජ්‍යයක් ගොඩනැගීම හා සම්බන්ධ වූ රජවරු අතරින් නොගැළපෙන පිළිතුර වන්නේ,

1. හත්වන හෙන්රි රජු
2. පළමුවන චාල්ස් රජු
3. හතරවන හෙන්රි රජු
4. ජැක්විස් කාටියර්
5. පර්ඩිනන්ඩ් ඉසබෙලා යුවල

10.) ක්‍රි.ව.1450 දී පමණ අයිබීරියන් අර්ධද්වීපයේ තිබූ ප්‍රධාන රාජ්‍යයක් වන්නේ,

1. ටෝකියෝ
2. පෘතුගාලය
3. ඉන්දියාව
4. ශ්‍රී ලංකාව
5. සුමාත්‍රා

## <u>පිළිතුරු පත්‍රිකාව</u>

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 1 | 6 | 3 |
| 2 | 3 | 7 | 2 |
| 3 | 2 | 8 | 2 |
| 4 | 3 | 9 | 4 |
| 5 | 1 | 10 | 2 |